# බුදුසසුන තුළ ගුරු-සිසු සබඳතා බිඳවැටීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආචාර්ය හෝමාගම ධම්මානන්ද හිමි

තථාගත බුදුරජාණන් වහන්සේගේ දේශනාව අනුගමනය කොට ආධ්‍යාත්මික ශාන්තියක් අපේක්ෂාවෙන් සම්බුද්ධ ශාසනයට ඇතුළත්ව එය නියෝජනය කරන ථේරවාද, මහායාන, තන්ත්‍රයාන වජ්‍රයාන, සෙන්, හා හුවායෙන් ආදී විවිධ සම්ප්‍රදාය හා නිකායාන්තර්ගත සමස්ත ප්‍රව්‍රජිතයන් සංඝ නාමයෙන් හඳුන්වන අතර මේ සියලුම දෙනා සම්බුද්ධ ශ්‍රාවකයෝ හෙවත් බුදුන් වහන්සේගේ ශිෂ්‍යවරයෝ වෙති. ආරම්භක අවධියේ දී සසුනට ඇතුළුවීමට කැමති වූවන්ට පැවිද්ද හා උපසම්පදාව (සාමණේර පැවිද්ද හා උපසම්පදාව) ලබා දී සසුන්ගත කරන ලද්දේ බුදුන් වහන්සේ විසින් ම ය. ප්‍රථම ධර්මදේශනාවේ සිට මෙසේ පැවිදිව සංඝ සමාජයේ පූර්ණ සමාජිකත්වය (උපසම්පදාව) ලැබූ භික්ෂු සංඝයා ඇමතූ බුදුන් වහන්සේ ප්‍රකාශ කර සිටියේ එක් මගෙක දෙදෙනෙකු නොගොස් ගම් නියම්ගම් සැරි සරා තමන් අවබෝධ කරගත් නිර්මල සම්බුද්ධ දේශනාව ඉදිරිපත් කොට ලෝක සත්වයා සසරින් මුදවාලීමට උත්සුක වන ලෙසයි.[1] තම ශාස්තෘන් වහන්සේගේ හෙවත් විමුක්ති දායක ගුරුවරයාගේ අනුශාසනාව අනුව ක්‍රියා කළ ප්‍රථම ශ්‍රාවක පිරිස ඒ ඒ ප්‍රදේශවල දහම් දෙසමින් සම්බුද්ධ ශාසනය ප්‍රචලිත කළා පමණක් නොව ඒ කෙරෙහි පැහැදුණු සහ සසුන්ගත වීමට කැමැත්ත දැක්වූ පිරිස් බුදුන් වහන්සේ වෙත පමුණුවා ඔවුන් පැවිදි උපසම්පදා කරවීමට ද මග පෙන්වූහ. මේ නිසා ඉතා සීඝ්‍රයෙන් සංඝ සමාජයේ සාමාජිකත්වය ද පුළුල් විය.

බුදුන් වහන්සේ වෙතින් එසේ එකවිට සිය දහස් ගණනින් පැවිද්ද ලැබීම නිසා පිරිස අතින් විශාල වුවත් සෑහෙන කාලයක්

ගතවන තෙක් සසුන නිරර්බුදව පැවති බව පසුකාලීනව බුදුන් වහන්සේ විසින් ම සිදු කළ ප්‍රකාශයන්ගෙන් තහවුරු වේ.[2] පඨම බෝධි සමය ලෙස ශාසන ඉතිහාසයෙහි නම් කර තිබෙන්නේ මෙම කාලවකවානුවයි.

පිරිස අතින් සංඝ සමාජය පෘථුලවීම එහි පැවැත්මට බාධකයක් නොවුවද පැවිදි උපසම්පදාව ලබාගැනීමේ හා ලබාදීමේ ක්‍රියාවලිය ක්‍රමයෙන් අතිශය සංකීර්ණ ස්වභාවයක් ගත්තේය. එයට ප්‍රධාන හේතුව වූයේ ධර්මය අසා එය අවබෝධකරගෙන එහි යෙදීමේ පහසුම ක්‍රමය පැවිද්ද බව බුදුන් වහන්සේගේ ම අනුශාසනාව පදනම් කොටගෙන වටහාගත් පිරිස්වලට පැවිදි උපසම්පදාව ලබාදීමේ කාර්යය බුදුන් වහන්සේ විසින් ම සිදුකිරීම නිසාය. මෙය වඩාත් සංකීර්ණ කාර්යයක් වූයේ, බුදුන් වහන්සේ එක් ස්ථානයක දිගු කලක් වැඩ නොසිටීමත් විවිධ වූ ඈත දුර බැහැර ප්‍රදේශවල සිට පැවිද්ද අපේක්ෂාවෙන් එන අයට දීර්ඝ කාලයක් ඒ සඳහා මිඩංගු කිරීමට සිදුවීමත් අතිශය දුෂ්කර වූ ගමනක යෙදීමට සිදුවීමත් නිසාය. මෙම කරුණ අවබෝධකරගත් බුදුන් වහන්සේ විසින් සංඝයාට ඒ ඒ තැන පැවිද්ද හා උපසම්පදාව ලබාදීම සඳහා අනුමැතිය දෙන ලදී.3 භික්ෂු සංඝයා විසින් ඒ ඒ ප්‍රදේශවලදී ම සංඝ සමාජයට ඇතුළුවීමට කැමති වූවන් පැවිදි උපසම්පදා කරවීම නිසා සසුන තවතවත් සීඝ්‍රයෙන් පුළුල් වූ බව පෙනේ.

සංඝ සමාජය තුළ ක්‍රමානුකූලව එකිනෙක ගැටුම් සහ අර්බුද හටගන්නේ, මෙසේ සමාජිකත්වය පුළුල්වීම ද ඇතුළු තවත් කරුණු කිහිපයක් නිසාය. විනය ශික්ෂා පද පැනවීමට ද හේතු වූ ආසවට්ඨානීය ධර්ම ලෙස විනයෙහි දක්වා තිබෙන්නේ ඒවාය.4 එනම්,

සංඝයා ආරම්භවී දිගුකල්ගතවීම

සංඝයා පිරිස අතින් විශාලවීම

සංඝයා වෙත බොහෝ ලාභ සත්කාර ලැබීම

සංඝයා දැන උගත්කමින් වැඩිවීම

ඕනෑම සංවිධානයක්, සංස්ථාවක්, කල්ගතවීමේ දී ආරම්භක

මූලික අරමුණුවලින් තරමක් දුරස්වීම ස්වාභාවිකය. නොවැලැක්විය හැකිය. සංඝ සමාජය ද ආරම්භක අවධියේ සිට දිගුකලක් එනම් වසර විස්සක් තරම් කාලයක් නිරර්බුද වූයේ, එහි මූලික අරමුණු සමග දැඩි බැඳීමකින් සාමාජිකයන් ක්‍රියා කිරීම නිසාය. ආරම්භක සාමාජිකයන් සියලුදෙනාගේ ම එකම අභිලාෂය වූයේ, විමුක්ති ප්‍රතිලාභයයි. එම පරමාර්ථය හා බැඳුණු සිතින් හැමදෙනා ම එකසේ ක්‍රියා කළා මිස, එයින් බැහැරට යාමට ඔවුනට ඉඩ අවකාශ නොතිබුණු අතර එසේ යාමට ශාස්තෘන් වහන්සේ ද ඉඩක් නොතැබූහ. මෙකල තුළ සංඝයා අතර ප්‍රශ්න හටනොග ැනීමේ ප්‍රවනතාව කොතෙක් ඉහළ අගයක් ගෙන තිබුණා දැයි යන්න පහත සිද්ධියෙන් මනාව තහවුරු වේ. වරක් සිංසපා වනයට වැඩම කළ බුදුන් වහන්සේ එහි වැඩ සිටි අනුරුද්ධ ආදී භික්ෂූන් තෙනම අමතා ආගිය තොරතුරු විමසූ විට උන්වහන්සේලා ප්‍රකාශ කර සිටියේ, කායික වශයෙන් තමන් වහන්සේලා තෙනම වෙන් වෙන්ව සිටියත් තමන්ට ඇත්තේ එකම සිතක් බවයි.5 මෙයින් පැහැදිලි වන්නේ, සංඝයා මොනතරම් සමගි සම්පන්නභාවයකින් තම තමන්ගේ මූලික අරමුණු හා බැඳී ක්‍රියා කළා ද යන්නයි. ඔවුනොවුන් හා ප්‍රිය ඇසින් බලමින් කිරි හා දිය මෙන් එක්ව එකට වාසය කිරීමට සංඝ සමාජය ආරම්භයේ සිටම නිරායාශයෙන් ක්‍රියාකොට ඇති බව බොහෝ සූත්‍ර දේශනාවන්හි සටහන්වී තිබේ. සුළු හෝ වරදක් දුටු තැන තමන්ගේ මූලික අරමුණ පිළිබඳ සිහි කැඳවීම් වශයෙන් අවවාදාත්මක ස්වරූපයෙන් බුදුන් වහන්සේ විසින් යම් යම් දේශන පවත්වා සෑහීමකට පත්වී තිබීමෙන් මේ බව වඩාත් සනාථ වේ.6 එහෙත් පසුකාලීනව එනම් විනය ශික්ෂා පද පැනවීමෙන් පසු භික්ෂූන්ට ඔවුනොවුන්ගේ වැරදි අඩුපාඩු හා අතපසුවවීම් සකසා ගැනීමට සහ විශේෂයෙන් නවකයන්ට අවශ්‍ය අවවාද අනුශාසනා කිරීමට සහ ශාසනික වත් පිළිවෙත් පුරුදු පුහුණු කිරීමට තිරසාර ක්‍රමවේදයක් බුදුන් වහන්සේ විසින් අනුදැන වදාරා තිබේ. එනම් අඩමසකට වරක් පොහොය සීමාවකට හෙවත් උපෝසථාගාරයකට රැස්ව උපෝසථ කර්මය කිරීමයි. එය ඉතාමත්ම වැදගත් සහ උසස් ශාසනික පිළිවෙතක් වන්නේ ශාසනයේ චිරපැවැත්මට එයින් ලැබෙන පිටිවහල ප්‍රමාණාතික්‍රාන්ත වන නිසාය. එහෙත් වත්මන් සංඝ සමාජය තුළ

මෙම පුරාණ වත් පිළිවෙත් කොතෙක්දුරට සක්‍රීයව පවතිනවාද යන්න ස්වයං විචේචනාත්මකව ආවර්ජනය කළ යුතුය. තවද තරාතිරම කුමක් වුවත් වරදක් දුටුවිට එම වරද පෙන්වා දීම සංඝ සමාජයට සුවිශේෂී වූ පිළිවෙතකි. එසේම වරද පෙන්වාදුන් විට එය තමන්ට නිධානයක් පෙන්වා දුන්නාක් යැයි සිතා ආචාරශීලීව පිළිගැනීම ද උතුම් ගුණයක් ලෙස දක්වා තිබේ.7

පංචකාම සම්පත් අතහැර නෛෂ්ක්‍රම්‍ය ජීවිතයකට අවතීර්ණ වූයේ, නැවත ඒ කෙරෙහි ඇලීමට නොවන බව මුල්කාලීන භික්ෂුව නිතර නිතර සිහිපත් කළේය. එහෙත් මෙසේ මූලික අරමුණ හා බද්දව පැවිදි ජීවිතයට ප්‍රවේශ වී එහි යෙදුන ප්‍රමාණය ක්‍රමයෙන් හීන වූ අතර ඉන් පරිබාහිර තවත් විවිධ වූ අරමුණු (ලෞකික) සාධනය කරගැනීමේ පහත් වූ අරමුණෙන් සංඝ සමාජයට ප්‍රවේශ වූවන් ශ්‍රමණ භාවයට නුසුදුසු, නොගැලපෙන, නොමනා හැසිරීම්හි යෙදෙන්නට විය. ඒ අතර ලාභසත්කාර ලැබීම, දනඋගත්කම් ඇතිකර ගැනීම, පහසු ජීවිතයක් ගතකිරීම ආදී අපේක්ෂාවන් තිබිණ. එකල ජනසමාජයේ ද ප්‍රචලිතව පැවතියේ මහලුබව නිසා, විවිධ ආබාධ නිසා, භෝගපරිහානිය සහ ඥාතිපරිහානිය වැනි කරුණු නිසා කෙනෙකු පැවිදිවීමට පෙළඹෙන බවයි. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ ක්‍රමානුකූලව සංඝ සමාජය පිරිහීමයි. බුදුන් වහන්සේ විසින් විනය ශික්ෂා පද පනවන්නේ, මෙම පසුබිම තුළින් සංඝ සමාජය කිසියම් ප්‍රමාණයකට පාලනය කරගැනීම පිණිසය.

සංඝ සමාජයේ පරිහානි ලක්ෂණ ප්‍රකට කිරීමට බලපෑ එක් ප්‍රධාන හේතුවක් ලෙස, බුදුන් වහන්සේ වෙත පමණක් පැවති පැවිදි කිරීම් සහ උපසම්පදාකිරීම් කටයුතු, උද්ගතවූ විවිධ දුෂ්කරතා, අර්බුද හා ගැටලු විසඳා ගැනීමක් ලෙස සංඝයාට පැවරීම දැක්විය හැකිය. භික්ෂු සංඝයා ප්‍රත්‍යන්ත ප්‍රදේශවල දී තමන් වෙත පැමිණෙන සසුන්ගත වන්නට කැමති වූවන් පැවිදි උපසම්පදා කිරීමේ දී අනුගමනය කරන ලද නිශ්චිත එක් ක්‍රමවේදයක් නොවීය. බුදුන් වහන්සේගෙන් පැවිද්ද ලැබූවන් බුදුන් වහන්සේ විසින් ම කිසියම් පරීක්ෂණයකට භාජනය කර, එනම් පූර්වාකෘත කුශල ශක්තිය ආදිය උන්වහන්සේගේ ආධ්‍යාත්මය මගින් පරීක්ෂා

කොට පැවිදි කළ බව කරුණු විමසමේ දී අනාවරණය වේ. බුදුන් වහන්සේ වෙතින් පැවිද්ද ඉල්ලුවේ නමුත් යම් යම් අය උන්වහන්සේ විසින් පැවිදි නොකර ප්‍රතික්ෂේප කළ අවස්ථා ද ධර්ම සාහිත්‍යයෙහි අපට හමුවේ. බාහිය දාරුචීරිය කථාපුවත මේ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකිය.

භික්ෂු සංඝයා විසින් එවැනි පරීක්ෂාවක් නොකිරීම සහ විශේෂයෙන් එවැනි පරීක්ෂාවක් කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා ද මත සීමා මායිම් නොමැතිව පැවිදි බව ලැබීමට ඕනෑම අයෙකුට මුල් කාලයේ අවකාශ තිබිණ. (පසු කලෙක දී පැවිදි උපසම්පදාව සඳහා යෝග්‍යතා මෙනවාද යන්න බුදුන් වහන්සේ විසින්ම දක්වා තිබේ) මෙසේ පැවිදි වූවන් අතරින් ඇතැම් කෙනෙක් තමන් පැවිදි කළ ගුරුවරයා කෙරෙහි හෝ උපාධ්‍යායන් වහන්සේ කෙරෙහි ගරුබුහුමන් දැක්වීම ආදියෙන් තොරව, ඇතැම් විට ඔවුන්ගේ වචනය නොතකා අකීකරුව හා හිතුවක්කාරී ලෙස තම තමන් කැමති දේ කිරීම් ආදිය නිසා සංඝ සමාජය තුළ යම් යම් අර්බුදකාරී තත්වයන් හට ගැනින. මේ නිසා වැඩිහිටි සහ ගිලන් භික්ෂූන් මෙන් ම මනා ගතිපැවතුම් ඇති භික්ෂූන් විවිධ අපහසුතාවනට පත් විය. එසේ ම මෙම නොහික්මුණු ක්‍රියාදාමයන් දැක ගිහි ජනතාව ද කලකිරීමට පත්විය. මෙයට හේතු වූයේ පැවිදි ජීවිතට අවශ්‍ය මූලික සිරිත් විරිත් පිළිබඳ නවක පැවිද්දන් තුළ නිසි අවබෝධයක් නොතිබීම ආදියයි.

යථොක්ත කරුණු වාර්තාවීම නිසා බුදුන් වහන්සේ විසින් පැවිදි උපසම්දා කර්මයන් සඳහා ආචාර්ය, උපාධ්‍යයන් වහන්සේලා පත් කොට උන්වහන්සේලා යටතේ නවක අන්තේවාසික, සද්ධිවිහාරිකයන් හික්මිය යුතු බවත් ඒ සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපදාවනුත් පෙන්වා දෙන ලදී. මේ අනුව ආචාර්ය, උපාධ්‍යායන් වහන්සේලා වෙත විශාල වගකීමක් පැවරෙන අතර නවක භික්ෂූන් වහන්සේලා උන්වහන්සේලා යටතේ කිසියම් කාල පරිච්ඡේදයක් ශාසනික ප්‍රතිපදාවන්හි හික්මිය යුතු බව ද විනය පිටකයෙන් අනුදැන වදාරා තිබේ. ආචාර්ය, උපාධ්‍යායන් වහන්සේලා විසින් අන්තේවාසික, සද්ධිවිහාරිකයන් කෙරෙහි කෙසේ පිළිපැදිය යුතුද යන්න මෙන්ම අන්තේවාසික, සද්ධිවිහාරිකයන් විසින් ආචාර්ය,

උපාධ්‍යායන් වහන්සේලා කෙරෙහි කෙසේ පිළිපැදිය යුතුද යන්න පිලිබඳ දිගු විවරණයක් චුල්ලවග්ගපාළියේ වත්තක්ඛන්ධකයේ සහ සේනාසනක්ඛන්ධකයේත් මහාවග්ගපාළියේ මාහාක්ඛන්ධකයේත් දක්වා තිබේ. මූලික වශයෙන් තම තමන් විසින් ආරක්ෂා කළ යුතු හෙවත් පෞද්ගලික පාරිසුද්ධිය සඳහා වන, ආදිබ්‍රහ්මචරියක ශික්ෂා හැරුණු කොට පොදු හෙවත් සාමුහික වගකීම් ලෙස මේවා දක්වා ඇති අතර ආභිසමාචාරික ශික්ෂා ලෙස ඒවා නම් කර තිබේ.

මෙම ලිපිය මගින් අප අපේක්ෂා කරන්නේ, යථොක්ත විනය පිටකානුකූල සම්ප්‍රදායයක් ලෙස ශක්තිමත්ව ගොඩනැගුණ සංඝ සමාජය තුළ වර්තමානයේ ගුරු සිසු සබඳතා බිඳවැටීම නිසා උද්ගතවී තිබෙන ශාසනික අර්බුද නිරාකරණය කරගැනීම සඳහා මග පෙන්විය හැකි විවෘත සංවාදයක් හෝ කථිකාවක් ගොඩනැගීමට අවශ්‍ය පසුබිම් සකස් කිරීමටයි. මෙය කිසියම් ආකාරයක ස්වයං විවේචනාත්මක ස්වරූපයෙන් දිගහැර අවබෝධ කරගත යුත්තක් මිස එකිනෙකාට ඇඟිල්ල දිගුකර අනෙකා නිදහස්වීමට උත්සාහ කිරීමෙන් විසඳාගත හැකි හෝ අවබෝධ කරගත හැකි හෝ ප්‍රපඤ්චයක් නොවන බව ආරම්භයේ දී ම සඳහන් කළ යුතුය.

මෑත කාලය තුළ ශාසන අභ්‍යන්තරයෙහි පවතින ගුරු සිසු සබඳතාවයේ දුරස්වීම ඉතාම උග්‍ර ගැටලුවක් බවට පත්වී තිබෙන්නේ කිසියම් අවධියක දී එකට ජීවත් වූ ගුරුවරයා සහ ශිෂ්‍යයා දෙපසකට වී එකිනෙකාගේ දුබලතා චෝදනා මුඛයෙන් ප්‍රකාශ කර තව තවත් දුරස්වීම හා අවසානයේ බොහෝවිට ශිෂ්‍යයා සිවුරු හැරයාම හෝ දෙදෙනාම නඩුමගට යාම විනා මිත්‍රශීලීව ශාසනික හැඟීමෙන් වැරදුණු තැන් නිවැරදි කරගෙන සහ කරුණු අවබෝධකරගෙන සමථයකට පත්වීම නොවේ. මෙය වත්මන් සංඝ සමාජය තුළ උද්ගතවී ඇති අතිශය ඛේදජනක සංසිද්ධියක් බව රහසක් නොවේ. එසේද වුවත් සමහර තැනෙක ගුරු සිසු සබඳතා ඉතාම උසස් ලෙස ශාසනික ප්‍රතිපදාවන්ට අනුකූලව ම පවත්වාගෙන යන අවස්ථා ද ඇති බව පෙන්වාදිය හැකිය.

යථෝක්ත ගැටලුව ගැන සාකච්ඡා කිරීමේ දී අපගේ මූලික අවධානය යොමු විය යුතු කරුණු කිහිපයක් ම තිබේ. ඒවා එකිනෙක ගෙන සාකච්ඡා කිරීම සමස්ත ගැටලුව සාකච්ඡා කිරීමක් වනු ඇති බව අපගේ හැඟීමයි. අප විසින් විමසිය යුතු කරුණු අතර ප්‍රධානතම කරුණ වන්නේ සැබවින් ම පැවිදි සමාජය තුළ ගුරු සිසු සබඳතාව පිළිබඳ ගැටලුවක් තිබේද යන්නයි. අනෙකුත් සියලු ගැටලු මේ මත රඳාපවතින බව ඉතා පැහැදිලිය. ඒවා එකිනෙක පහත සඳහන් පරිදි පෙළගස්වමු. යථෝක්ත ගැටලුව සැබවින්ම පවතින්නක් නම් එහි මූලික ස්වරූපය කුමක්ද? මෙම ගැටලුවල මූලයන් මොනවාද? ගුරුවරයාගේ වගකීම් මොනවාද? ඒවා නිසිපරිදි ඉටුවේද? ශිෂ්‍යයාගේ වගකිම් මොනවාද? ඒවා නිසිපරිදි ඉටුවේද? වෙනත් බාහිර පාර්ශවයන් විසින් මෙම අර්බුද ඇතිකරන්නේද? එසේ නම් ඒවා වළක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද? ශාසන භාරධාරී මහතෙරවරුන් මේ සම්බන්ධයෙන් කෙසේ ක්‍රියා කළ යුතුද? ඔවුනට මේ සඳහා ආදේශ කළ හැකි සහ පොදුවේ කාටත් පිළිගත හැකි යාන්ත්‍රණයක් තිබේද?. ඒවා කෙතරම් විශ්වසනීයද? මේ ගැටළු නිසා අගතියට පත්වන්නේ කවුරුන්ද? ඒවා යථා තත්වයට පත් කරන්නේ කෙසේද? යනාදිය විමසීම ඒ අතර ප්‍රධාන වී තිබේ.

ගැටලුවේ මූලික ස්වභාවයන් පිළිබඳ පැහැදිලි චිත්‍රයක් විද්‍යමාන නොවුවත් ගිහිසමාජයට ද ඉහළ ප්‍රතිසතයකින් අනාවරණය වී ඇති පරිදි පැවිදි සමාජය තුළ ගුරු සිසු සබඳතාව පිළිබඳ පැහැදිලිව ම ගැටලුවක් තිබේ. මේ සඳහා ඉදිරිපත් කළ හැකි ප්‍රබල සාධකයක් වන්නේ නිකායික සංඝ සභා හෝ මූලස්ථානවල වාර්තාවන්ය. මෙම වාර්තාවල (මාසිකව හෝ ද්විමාසිකව හෝ ත්‍රයිමාසිකව හෝ පවත්වනු ලබන සංඝසභා රැස්වීම් වාර්තාවල) බහුල වශයෙන් සාකච්ඡා වන මාතෘකාවක් බවට පත්වී තිබෙන්නේ, ගුරුවරුන් සහ සිසුන් අතර පවත්නා අර්බුද නිරාකරණය කිරීම් ආදියයි. මෙයට අතිරේකව රටේ සිවිල් නීතියේ රැකවරණය පතා ගුරු සිසු දෙපිරිසම යන අවස්ථා ද වාර්තා වේ. මෙය සංඝ සමාජය තුළත් පොදුවේ සම්බුද්ධ ශාසනය තුළත් ප්‍රබල ගැටලුවක් බවට පත්වී තිබෙන්නේ, සංඝ සමාජයේ

සහ සම්බුද්ධ ශාසනයේ ඉදිරි පැවැත්මට මෙය අභියෝගයක් වී තිබෙන නිසාය. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් මෙය ශාසනික පරිහානියකට ප්‍රබල සාධකයක් වී තිබේ. මේ නිසා ගිහි සමාජය කණ්ඩායම් වශයෙන් භේදභින්න වීම, ශාසනික කටයුතු විනයානුකූලව පවත්වාගෙනයාමට නොහැකි වීම, විනයට පටහැනි ක්‍රියා සිදුවීම (එකම විහාරස්ථානයේ එක් වස්කාලයක් අවසානයේ සිදු කළ හැක්කේ එක් කඨින පූජාවක් යැයි යන සම්මතය හා විනය නීතිය කඩ කරමින් කඨින පූජාවන් කිහිපයක් කිරීම), උසාවිවලට ගොස් නීතියේ සරණ පැතීම, ගහබැන ගැනීම් උග්‍ර වී සමහරවිට මනුෂ්‍ය ඝාතන පවා සිදු කිරීම (ශිෂ්‍යයා විසින් ගුරුවරයා ඝාතනය කිරීම) ශාසනික දේපළ විනාශ වීම ආදිය යථෝක්ත ගැටලුවේ අතුරුඵල වශයෙන් දක්නට ලැබේ.

ගුරු සිසු සබඳතා මනාව නොපැවතීමට හෝ බිඳවැටීමට බලපා ඇති සාධක මොනවාද යන්න හරිහැටි අවබෝධ කර ගැනීම මේවා නිරාකරණය කර ගැනීමට හෝ නැවත ඒවා ඇති නොවීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා ශාසන භාරධාරී මහතෙරවරුන්ටත් ගුරු සිසු දෙපිරිසටත් තිරසාර මගපෙන්වීමක් සපයනු ඇත. ගුරු සිසු සබඳතා බිඳවැටීම කෙරෙහි බලපා ඇති ප්‍රධානතම සාධකය වන්නේ පොදුවේ සංඝයා විසින් ආරක්ෂා කළ යුතු යැයි බුදුන් වහන්සේ විසින් පනවා වදාළ ආභිසමාචාරික ශික්ෂණයෙන් හෙවත් ශාසනික වත් පිළිවෙත් වලින් සංඝයා දුරස් වීමයි. ගුරුවරයකු හා ශිෂ්‍යයකු අතර පැවතිය යුතු සබඳතාව කුමක්ද යන්න බවත් එය කෙසේ සංවිධානය විය යුතුද යන බවත් චුල්ලවග්ගපාළියේ වත්තක්ඛන්ධකයේ සහ සේනාසනක්ඛන්ධකයේත් මහවග්ගපාළියේ මහාඛන්ධකයේත් මනාව දක්වා තිබෙන බව ඉහතදී ද සඳහන් කරන ලදී. ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි පුත්‍රස්නේහයෙන් අනුකම්පා කළ යුතු බවත් ශිෂ්‍යයා ගුරුවරයා කෙරෙහි පිය සෙනෙහසින් අනුකම්පා කළ යුතු බවත් ශාසනික පිළිවෙතයි. එහෙත් මෙය එසේ සිදු වන්නේද යන්න දැඩිව විමර්ශනයට භාජනය විය යුතු කරුණකි.

පිය පුතු සබඳතාව ඉතා දැඩි එකකි. ගිහි සමාජයේ එය ලේ ඥාතිත්වය මත රඳාපවතින බැඳීමකි. එසේම එය කිසිසෙත් වෙන්

කළ නොහැකි බැඳීමක් ද වේ. මෙම බැඳීම පියකු වූ පමණින් හෙවත් සම්මත විවාහ සම්බන්ධතාව නිසාම සිදු වන්නක් නොවේ. ඔවුනොවුන් විසින් ඉටුකළ යුතු යුතුකම් කොටස ද මනාව ඉටු කිරීමෙන් දැඩි වන ශක්තිමත් වන බැඳීමකි. ගුරු සිසු බැඳීම මෙයට හාත්පසින්ම වෙනස් වූවකි. එහි ලේ සම්බන්ධකමක් නැත. එහි ඇත්තේ ශාසනික සම්බන්ධයක් පමණි. එනම් සම්මත පිය පුතු සම්බන්ධයකි. එය ශක්තිමත් වන්නේ, මුළුමනින් ම අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් මතය. එසේම අවබෝධය හා අන්‍යෝන්‍ය ගෞරවය මතය. වැඩිහිටි භික්ෂුවක් විසින් ශිෂ්‍යවරයකු පැවිදි කිරීමේ සිට කළ යුතු සියලු කාර්යයන් ආචාර්ය, උපාධ්‍යාය වත්වල මනාව දක්වා තිබේ. වර්තමානයේ මේ පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරන ගුරුවරුන් කොපමණ සිටීද යන්න අපවිසින් අපගෙන් ම ඇසිය යුතු ප්‍රශ්නයකි. නිදසුනක් ලෙස දක්වන්නේ නම් වත්තක්ඛන්ධකයේ දක්වන ආකාරයට ශිෂ්‍යයකු ගිලන් වූ විට ගුරුවරයා විසින් නොකළ යුත්තේ වැඳුම් පිදුම් කිරීම පමණි. අනෙක් සියලු කටයුතු කළ යුතුය. එනම් කැවීම් පෙවීම් නැහැවීම් සිවුරුපිරිකර සෝදාදීම් ආදී සියලු වතාවත් කළ යුතුය. දෛනික ජීවිතයේ දී ගුරුවරයා වෙනුවෙන් කිසියම් කාර්යයක් ශිෂ්‍යයා විසින් සිදු කරන්නේද ඒ සියලු කටයුතු ගුරුවරයා පෙරළා ශිෂ්‍යයා වෙනුවෙන් ඔහු ගිලන් වූ විට කළ යුතු අතර ප්‍රධාන වශයෙන් සියලුම වත් පිළිවෙත් පුරුදු පුහුණු කළ යුතුය. එසේ කිරීමට නොහැකි නම් සිසුන් පැවිදි කිරීම යෝග්‍ය නොවේ.

ආරම්භක අවධියට වඩා වර්තමානයේ දරුවන් සසුන්ගත කිරීමේ අරමුණු වෙනස් බව ඉතා පැහැදිලි කරුණකි. එහෙත් එම වෙනස්කම් අහසට පොළව මෙන් දුරස් වූ ඒවා නොවිය යුතුය. ගුරු සිසු සබඳතාවයේ ගැටලු මතුවන්නේ පැවිදි කිරීමේ අරමුනේ සිටය. වර්තමානයේ ආචාර්ය, උපාධ්‍යායන් වහන්සේලා සිසුන් පැවිදි කිරීම්වල අරමුණු පෙළ ගැස්වුවහොත්,

> තමන්ගේ යැයි සම්මතකොටගත් ශාසනික දේපළ සහ පෞද්ගලිකව උපයාගත් දේපළ තම ඥාතියකුට පැවරීම සඳහා පැවිදි කිරීම
>
> ගිහි සමාජයේ පවතින අනියම් සබඳතාවන්හි ප්‍රතිඵල

වශයෙන් පැනනගින ගැටලු සඳහා විසඳුම් වශයෙන් විවිධ පාර්ශවයන්හි ද බලපැම් මත පැවිදි කිරීම

විශේෂයෙන් පිරිවෙන් වැනි ආයතන පවත්වාගෙන යාම සඳහා පැවිදි කිරීම

පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලැබීමේ අපේක්ෂාවෙන් පැවිදි කිරීම

විහාරස්ථානයේ දෛනික කටයුතු කරගෙනයාම සඳහාම පැවිදි කිරීම

මව්පියන් අහිමි වීම් ආදී විවිධ අයුරින් අසරණ වූවන්ට පිහිට වීමක් වශයෙන් පැවිදි කිරීම

ඉහත සඳහන් කරුණුවලට අතිරේකව පැවිදි භාවය ලබන අයගේ ද පැවිදි වීමේ අරමුණු විවිධ වීම නිසා ද පසුකාලීනව ගුරු සිසු සබඳතා බිඳවැටීම් දක්නට ලැබේ. ඒ අතර,

අසාර්ථක විවාහ ජීවිතවල ප්‍රතිඵල වශයෙන් මව්පියන් වෙන්වීම නිසා අතරමං වන දරුවන් ඥාතීන්ගේ හෝ වැඩිහිටියන්ගේ බලපෑම මත පිළිසරණක් සොයා සසුන්ගත වීම

හොඳ අධ්‍යාපනයක් ලබා පසුව සිවුරු හැර යාමේ අදහසින් පැවිදිවීම

නිවෙස්වල තිබෙන විවිධ දුෂ්කරතා මධ්‍යයේ වාසය කිරීමට වඩා සුව පහසු සහ රැකවරණය සහිත ආරක්ෂිත ස්ථානයක් ලෙස සලකා පැවිදිවීම

කිසිදු අරමුණක් නැතිව හා අවබෝධයෙන් තොරව වැඩිහිටියන්ගේ බලපෑම නිසා පැවිදිවීම

යථොක්ත කරුණුවලට අතිරේකව ගුරුවරුන්ගේ පාර්ශවයෙන් පැවිදි කිරීමටත්, සිසුන්ගේ පාර්ශවයෙන් පැවිදි බව ලැබීමටත් වර්තමාන සමාජ තත්වයන් සලකා බැලීමේ දී පිළිවෙලින් පහත සඳහන් කරුණු දෙක යෙදෙන්නේ නම් අතිශය ශක්තිමත් ගුරු සිසු සබඳතාවකට පදනම සකස් වේ. එනම්,

1. සැබවින්ම මනා අධ්‍යාපනයක් ලබාදී ශාසනික ප්‍රතිපදාවන් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ශාසනික හැඟීමෙන්ම ගුරුවරුන් සිසුන් පැවිදි කිරීම
2. හුදු ශාසනික හැඟීමෙන් ම හෙවත් ශ්‍රද්ධාවෙන්ම හා සසර පුරුදු මතම පැවිදි බිමට පත්වීමට සිසුන් පෙළඹීම

පැවිදි කිරීමේ අරමුණු අපහැදිලි වීමත් ශාසනික වත් පිළිවෙත්, පිළිබඳ අනවබෝධය හෝ නොසැලකිලිමත් බවත්, ශාසනික හැඟීමෙන් දුරස්වීමත් ආදී තවත් බොහෝ කරුණු සිසුන් පැවිදි කිරීමේදී ගුරුවරයාගේ පාර්ශවයේ තිබෙන දුබලතා ලෙස හඳුනා ගත හැකිය. පැවිදිබව ලැබීමෙන් පසු සිසුන්ගේ පාර්ශවයෙන් ද විවිධ අතපසුවීම් සහ නොසලකාහැරීම් සිදුවේ. මේ තත්වයන් උදාවන්නේ බොහෝවිට වයස 15, 16 ඉක්මයාමෙන් පසුව බව පෙනී යයි. එනම් අධ්‍යාපනයේ කිසියම් කඩඉමක් පසුකිරීමත් සමගය. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් ගුරුවරයාගෙන් ස්වාධීන වීමේ අවශ්‍යතාව ආදි තවත් බොහෝ කරුණුය. මේ සඳහා ප්‍රකාශ කළ නොහැකි ගුරුවරුන්ගේ විවිධ දුබලතාද සාධක වන බව පෙන්වා දිය හැකිය. ඒ අතර නූගත්කම්, දැඩි ප්‍රතිපත්ති, හිතාමතා නොසලකාහැරීම්, සිසුන් කිහිපදෙනෙකු සිටින විට එක් එක් අයට එක් එක් ආකාරයට සැලකීම, පූර්ව නිගමනවල සිට ක්‍රියා කිරීම, අපිළිවෙල, සිසුන්ගේ දුබලතා පිරිස් ඉදිරියේ ප්‍රකාශ කොට සිසුන් අපහසුතාවයට පත් කිරීම හා ඔවුන්ගේ පෞරුෂයට හානි කිරීම, ගුරුවරයාට වඩා ඉහළ අධ්‍යාපනයක් ශිෂ්‍යා ලැබීම නොරිස්සීම හා අධ්‍යාපනික අවස්ථා ඇහිරීම, විශේෂයෙන් විශ්වවිද්‍යාල වැනි උසස් ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් කෙරෙහි ගුරුවරුන්ගේ අඩු අවධානය සහ අවම පහසුකම් සැපයීම හෝ නොසලකා හැරීම, සමාජයට ශිෂ්‍යා හඳුන්වා නොදීම හා වගකීම් නොපැවරීම, ශිෂ්‍යයාට කිසිදු නිදහසක් ලබා නොදීම හා විවිධ අයුරින් පීඩාවට පත් කිරීම, තම ශිෂ්‍යායට වඩා වෙනත් අය හෝ පාර්ශවයන් තමා සමීපයට ගැනීම, ආදිය දැක්විය හැකිය.

සුළුවෙන් පැනනගින භේදභින්නතා, නොරිස්සුම්කම්, චිත්තපීඩා ක්‍රමයෙන් වර්ධනය වන්නේ, අන්‍යෝන්‍ය ගෞරවය

බිඳීයාම නිසාය. මේවා සමතයකට පත්කිරීමට වඩා, උග්‍රවීමට හා උග්‍ර කිරීමට බාහිර පාර්ශවයන් ද දායක වන බව පෙනීයයි. බාහිර පාර්ශවයන් විසින් එසේ කරන්නේ, පෞද්ගලික ලාභ අපේක්ෂා පදනම් කරගෙන බව ද නොරහසකි. අනෙක් අතට විශේෂයෙන් සිසුන් නොමගට යාමට සහ ගුරුවරුන් නොසලකා හැරීමට වර්තමානය තුළ උග්‍රතම සාධකයක් වී තිබෙන්නේ, සිසුන්ට ලැබෙන ලාභ ප්‍රයෝජනයන්ය. ඒ අතර ප්‍රබලම කරුණ වන්නේ මුදල් ලැබීමයි. මෙය පාලනයකින් තොරව සිදුවීමයි, ගැටලුවක් වී තිබෙන්නේ. මුදල් ලැබීම නිසා ගිහි සමාජය මෙන්, නොඑසේ නම් ගිහි සමාජය ද ඉක්මවා ගොස් තාක්ෂණික මෙවලම් භාවිතයට ගැනීම ගුරු සිසු සබඳතා බිඳවැටීමට ප්‍රබලම සාධකයක් වී ඇති බව පෙන්වා දිය හැකිය. මේ නිසා ශාසනික අධ්‍යාපනයට වඩා ගිහි සිසු දරු දැරියන් මෙන් වෙනත් අධ්‍යාපන අංශයන්ට නැඹුරුවීම හා ඒ ඔස්සේ ශාසනික හැඟීමෙන් ඈත්වීම ගැටලු නිර්මාණය වීම සඳහා හේතු වේ. තම තමන්ට ලැබෙන ලාභසත්කාර හමුවේ අවබෝධයෙන්, අද්දැකීමෙන් හා හැඟීමෙන් තොර ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ ගුරුවරයාගෙන් ස්වාධීන වීමට සහ අත්තනෝමතිකව තීරණගෙන ක්‍රියා කිරීමට ක්‍රමයෙන් පෙළඹීම පෙර තිබුණු ශාසනික ගුරු සිසු සබඳතාවයන් දුරස්වීමට සිසුන්ගේ පාර්ශවයෙන් සිදු වන බරපතල දුර්වලතාවයන් ලෙස දැකිය හැකිය.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් තිබේ. එනම් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතුවල නිරතවී සිටින පැවිදි සිසුන්ගේ ආකල්ප සම්පත්තියයි. ඉහත අපවිසින් සාකච්ඡා කළ පැවිදිභාවයට පත්වන්නන්ගේ සහ පැවිදි කරවන්නන්ගේ විවිධ දුර්වලතා මධ්‍යයේ වුව ද උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන විශ්වවිද්‍යාල හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුලත්වන පැවිදි සිසුන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් සාම්ප්‍රදායික ශාසනික ප්‍රතිපත්තීන්ගෙන් දුරස්වී වගකීම් විරහිතව ක්‍රියාකරනු දක්නට ලැබේ. එයට එක් ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ ශාසනික ආකල්පයන්ගෙන් බැහැරවීමත් අනාගත දැක්මකින් තොරව කටයුතු කිරීමත්ය. උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතුවල නිරතවී සිටින ගිහි සිසුන්ට විවිධ

ඉලක්ක සහ අරමුණු තිබේ. රැකියාවක් කිරීම, නිවසක් තනාග ැනීම, විවාහ ජීවිතයට ඇතුලත්වීම, දෙමව්පියන් රැකබලා ගැනීම, උසස් සමාජ ජීවිතයක් ගතකිරීම වැනි අනාගත සිහින ඔවුනට තිබේ. එමනිසා මිලමුදල් අරපරිස්සමින් පරිහරණය කොට මෙම අරමුණු කරා ළඟාවීමට සැලසුම් සහගතව ක්‍රියා කිරීම ඔවුන්ගේ එකම අභිලාශයයි.

එහෙත් මේ සියල්ලෙන් බැහැර වන පැවිදි සිසුන් විනෝදකාමී සහ අසීමිත වූ නිදහස් සහ කෙළිලොල් ජීවිතයක් කරා නැඹුරුවී තිබීම බහුල වශයෙන් දැකගත හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස එක්පැත්තකින් අධ්‍යාපනයෙන් ද සුරස් වී අවම සාමාර්ථයන් සහිතව හෝ වසර ගණනාවක් අසමත්වීම නිසා නැවත නැවතත් විභාගවලට ඉදිරිපත් වී යන්තමින් විභාගය සමත්වන ඔවුහු අවසානයේ විහාරස්ථානය සහ ස්වකීය පැවිදි ආචාර්යවරයා ද අතහැර උපැවිදි වෙති. මෙය ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන්නක් බව අද්දැකීම් සහිතව ප්‍රකාශ කළ හැකිය.

තවද සිසුන්ගේ පාර්ශවයෙන් සිදුවන වැරදීම් අතර ගුරුවරයාට වඩා උසස් අධ්‍යාපනයක් ලැබීම නිසා ගුරුවරයා නොසලකා හැරීම හා නිසි ගෞරවයක් නොදැක්වීම, ගුරුවරයාගේ දුබලතා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට ගුරුවරයා අපහසුතාවයට පත් කිරීම, ගුරුවරයාගේ පෞද්ගලිකත්වයට අනවශ්‍ය ලෙස ඇඟිළිග ැසීම, ගුරුවරයා හා සම්බන්ධ විවිධ පාර්ශවයන් සමග ගැටුම් ඇතිකරගැනීම, ගුරුවරයා භුක්තිවිඳින සියලු වරප්‍රසාද තමන්ටත් හිමිවිය යුතු යැයි සිතා කටයුතු කිරීම, (දෙව්දත් තෙරුන් බුදුන් වහන්සේ සමග ගැටුම් ඇතිකර ගත්තේ මෙසේ සිතීම නිසාය) ගුරුවරයා සිදු කරන ආගමික ශාසනික කටයුතුවලට ප්‍රමාණවත් දායකත්වයක් ලබා නොදීම හා සමහරවිට ඒවා කඩාකප්පල් කිරීම, සමාජය ගුරුවරයා කෙරෙහි කලකිරවීම යනාදීය විද්‍යමාන සිසු දුබලතා ලෙස පෙන්වාදිය හැකිය.

පැරණි ශාසනික සම්ප්‍රදාය තුළ ගුරු සිසු සබඳතා වඩාත් ශක්තිමත්ව පැවතියේ එක් පැත්තකින් අධ්‍යාපනයේ ද අනෙක් පැත්තෙන් ආචාර්ය, උපාධ්‍යායන් වහන්සේලා පෞද්ගලිකව ම තම සිසුන්ගේ ඕනෑ එපාකම් සොයාබලා ඔවුන් වෙනුවෙන්

කැපවීමේ ද ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් වර්තමාන බොහෝ ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා ශාසනික වශයෙන් මෙන් ම වෙනත් බොහෝ කාර්යයන් ද නිසා කාර්ය බහුල ජීවිත ගත කිරීම සිසුන් ශාසනික වත් පිළිවෙත්වලින් දුරස් වීමට ප්‍රමුඛ සාධකයක් වී ඇති බව සඳහන් කළ යුතුමය. වර්තමානයේ මේ අංශ දෙකෙන්ම භික්ෂු සමාජය ගිලිහීගොස් ඇතිබව සඳහන් කළ යුතුය. අධ්‍යාපනික කාර්ය මෙයින් ප්‍රමුඛ වේ. ප්‍රාචීන අධ්‍යාපනයට නවක භික්ෂූන් වහන්සේ යොමු නොවීම නිසා එමගින් ලැබෙන ධර්ම විනය හා ශබ්ද ශාස්ත්‍ර ඥානයෙන් දුරස්වීම සංඝ සමාජයේ පිරිමැසිය නොහැකි කඩාවැටීමකි. තව ද වයස අවුරුදු 15-20 ත් අතර සාමණේර භික්ෂූන් වහන්සේලා තමන්ට ඔරොත්තු නොදෙන සහ නොගැලපෙන තාක්ෂණික උපකරණයන්ට (ජංගම දුරකථන හා පරිඝණක) ඇබ්බැහි වීම හැම අංශයකින් ම අධ්‍යාපනය කඩා වැටීමට මෙන් ම ගුරුවරුන් සමග විවිධ ගැටුම් නිර්මාණය කර ගැනීමට ප්‍රබල සාධකයක් වී ඇති බව ඉතාම ප්‍රකට කරුණකි. මෙම වාතාවරණය වෙනස් කර ගැනීම සඳහා යෝග්‍ය කථිකාවතකට අවතීර්ණ වීම සහ කාලෝචිත නියාමනයක් ඇති කිරීම අත්‍යාවශ්‍ය සාධකයකි.

මේ තත්ත්වය පාලනය කරගත හැක්කේ නීති රීති අනපනත් මගින් සීමා පැනවීමෙන් නොව මනා ආකල්ප සම්පත්තියක් සංවර්ධනය කිරීමෙන් පමණි. මේ සඳහා පැවිදි ආචාර්යවරුන්, සිසුන් සහ දෙමව්පියන් හෝ භාරකරුවන් මෙන්ම ශාසනභාධාරිත්වය උසුලන නිලලත් පාර්ශවයන්ගේ ද එකමුතුවෙන් යුතු තිරසාර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. පැවිදි සිසුන් අපේක්ෂිත ඉලක්ක කරා යොමු කිරීම ස්වකීය පැවිදි ආචාර්යවරයාට පමණක් පැවරෙන වගකීමක් නොවේ. ලංකාව තුළ පැවිද්දන් සඳහා වුවමනාවටත් වඩා පැවිදි අධ්‍යාපන ආයතන පැවතියත් යථොක්ත කරුණ කෙරෙහි අවධානය යොමු කරගත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක ආයතනයන්ගේ හිඟකම වර්තමානයේ පැවිදි සමාජය මුහුණ දී තිබෙන බරපතලම ගැටලුවයි.

සසුනෙහි හා සම්බුද්ධ දේශනයෙහි චිර පැවැත්ම උදෙසා මනා ගුරු සිසු සබඳතාව පමණක් නොව සංඝයාගේ සමගි

සම්පන්න භාවය ද අතිශය වැදගත් සාධකයක් බව බුදුන් වහන්සේ පෙළ සාහිත්‍යයෙහි බොහෝ තැන්වල අවධාරණය කර තිබේ. 'තවද මහණෙනි, සංඝයා සමගි සම්පන්න නම් සතුටු සිත් ඇත්තාහු නම් විවාද නොකරන්නාහු නම් එක්ව පාමොක් උදෙසන්නාහු පහසු විහරණයෙන් යුතු නම් සංඝයා සමගි බැවින් එකිනෙකාට ආක්‍රෝශ නොකරත් නම් පරිභව නොකරත් නම් එකිනෙකා වෙන්කර නොකියත් නම් එකිනෙකා බැහැර නොකරත් නම් එය නොපැහැදුනවූවන්ගේ පැහැදීම පිණිසත් පැහැදුනවූවන්ගේ වැඩි පැහැදීම පිණිසත් වන බැවින් සද්ධර්මයෙහි චිරස්ථිතිය පිණිස වෙයි.' මෙහි ආරම්භයේ දී සඳහන් කළාක් මෙන් ඕනෑම සංවිධානයක් කල්ගත වීමේ දී ආරම්භක අවස්ථාවේ පැවති මූලික අරමුණුවලින් ක්‍රමයෙන් ඉවත්වීම නිසා ගැටුම් ගැටලු හැළ හැප්පීම් ස්වභාවයෙන්ම ඇති වේ. මේවා වරින්වර සාකච්ඡා කොට නිසි පිළියම් යෙදවීමෙන් ම සකසාගත යුතුය. ශාසන ඉතිහාසයෙහි සංගායනා සහ කතිකාවත් වශයෙන් ව්‍යවස්ථාවන් ගොඩනගා ගත්තේ මේනිසාය. වර්තමානයේ එවැන්නක අවශ්‍යතාව ද උග්‍රලෙස දැනෙන බව පෙන්වාදිය හැකිය.

ගුරු සිසු සබඳතාව බිඳවැටීම නිසා පීඩාවට පත් වන්නේ කවුරුන්ද? මෙම ගැටලුවේ ප්‍රතිඵල වශයෙන් එක්කෝ ශිෂ්‍යයා සිවුරුහැර යයි, නැත්නම් ගුරුවරයාගෙන් වෙන්වී වෙනම වාසය කරයි. එසේත් නොමැති නම් ගුරුවරයාට එරෙහිව විවිධ ක්‍රියා සිදු කරන අතර අවසාන වශයෙන් නඩුමගට බැසීම හෝ කුමන පාර්ශවයක හෝ ජීවිත හානියකින් ගැටලුව තවත් උග්‍ර අතට හැරී හෝ කෙළවර වේ. මෙහිදී අපගේ සැලකිල්ලට භාජනය විය යුතු කරුණ වන්නේ, මේ තුළින් පැහැදිලිව ම අගතියට පත්වන්නේ කුමන පාර්ශවයද යන්නයි. කෙනෙකුට බැලූ බැල්මට පෙනී යන්නේ, එක්කෝ ගුරුවරයා නැත්නම් ශිෂ්‍යා හෝ එම දෙපාර්ශවයට සම්බන්ධ පිරිස් මේ නිසා පීඩාවට හෝ අගතියට භාජනය වන බවයි. එහෙත් සැබවින්ම හානි සිදු වන්නේ සම්බුද්ධ ශාසනයටයි, නැත්නම් ශාසනික පැවැත්මටයි. වර්තමානය තුළ බුදු සසුනේ පැවැත්මට විවිධ ආකාරයේ බාහිර බලවේගයන්ගෙන් සිදුවන අභියෝග හමුවේ, අර්බුදයකට ගොස් තිබෙන සසුනෙහි

පැවැත්ම පිළිබඳ වගකිව යුතු ශාසන භාරධාරිත්වය, බාහිර අභියෝග කෙසේ වෙතත් අභ්‍යන්තරික වශයෙන් පැනනැඟී තිබෙන යථෝක්ත ගුරු සිසු සබඳතාව පිළිබඳ ගැටලුව කෙරෙහි ඉතා සංවේදීව සහ ප්‍රවේශමෙන් අවධානය යොමු කළ යුතු කාලය එළඹ ඇති බව අවධාරණය කළ යුතුය. මෙහිදී සංඝ මූලස්ථානවලට කළ හැකි කාර්යභාරයේ ද සීමා මායිම් පවතින බව පෙනී යයි.

වර්තමාන සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම වෙනුවෙන් යථෝක්ත ගැටලුවට විසඳුම් වශයෙන් සංඝ මූලස්ථානයන්ගේ මැදිහත් වීමෙන් පහසුවෙන් හා පරිස්සමින් කළ හැකි ප්‍රබලතම කාර්යය වන්නේ, ගුරු සිසු දෙපාර්ශවය අතර පැහැදිලි ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා අවශ්‍ය ශක්තිමත් සංවාද මණ්ඩපයක් ඇති කිරීමයි. නිකාය භේදය, පලාත් භේදය හෝ පාර්ශව භේදය නොසලකා වර්තමාන ශාසන භාරධාරීන්ගේ බරපතල වගකීමක් පමණක් ලෙස සලකා මේ සඳහා අවශ්‍ය පියවර ගතයුතුය. මේ සඳහා අවශ්‍ය භෞතික සම්පත් මෙන් ම පුද්ගල සම්පතද නොඅඩුව වත්මන් සසුන සතු බව ද පෙන්වාදිය හැකිය. මෙයට අතිරේකව ගුරු සිසු සබඳතාව ශක්තිමත් කිරීම සඳහා දෙපාර්ශවයටම අගතියක් නොවන සාධාරණය ඉටු වන ශාසනික නීතිරීති අන්තර්ගත කථිකාවතක් කෙරෙහි ද නොපමාව අවධානය යොමු කළ යුතු බවද මෙහිදී පෙන්වාදිය හැකිය.

## ආන්තික සටහන්

1. චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය අත්ථාය හිතාය සුඛාය දේවමනුස්සානං, දේවමනුස්සානං.'' *මහාවග්ගපාළි I*, බු.ජ.මු. 42 පිටුව.
2. නිරබ්බුදෝහි සාරිපුත්ත භික්ඛු සංඝෝ නිරාදීනවෝ අපගත කාලකෝ සුද්ධෝ සාරේ පතිට්ඨිතෝ, *මහාවග්ගපාළි I*, බු.ජ.මු. 44 පිටුව.
3. අනුජානාමි භික්කවේ තුම්හේවදානි තාසු තාසු දිසාසු තෙසු තෙසු ජන-පදේසු පබ්බාජේථ උපසම්පාදේථ, *මහාවග්ගපාළි I*, බු.ජ.මු. 44 පිටුව.
4. යථෝච බෝ සාරිපුත්ත ඉධෙකච්චේ ආසවට්ඨානීයා ධම්මා සංඝේ පාතු භවන්ති අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤපේති උද්දිසති පාතිමොක්ඛං තේසඤ්ඤේව ආසවට්ඨානීයා ධම්මානං පටිඝාතාය, *පාරාජිකපාළි*, වේරඤ්ජ කාණ්ඩය, බු.ජ.මු. 22 පිටුව.

5. නානාහි බෝ පන භන්තේ මේ කායා ඒකඤ්ච පන චිත්තන්ති, *මජ්ඣිමනිකාය I,* බු.ජ.මු. 496 පිටුව.
7. න මේ භික්ඛවේ තේසු භික්ඛූසු අනුසාසනී කරනීයා අහෝසි සතුප්පාද කරනීයමෙව මේ භික්ඛවේ තේසු භික්ඛූසු අහෝසි, *මජ්ඣිමනිකාය I,* බු.ජ.මු. 312 පිටුව.
7. නිධීනංව පවත්තාරං-යං පස්සේ වජ්ජදස්සිනං
නිග්ගයිහවාදිං මේධාවිං-තාදිසං පණ්ඩිතං භජේ
තාදිසං භජමානස්ස-සෙයෙයා් හෝති න පාපියෝ, *ඛුද්දකනිකාය,* බු.ජ.මු. 40 පිටුව.
8. චත්තාරිමානි භෝ රට්ඨපාල පාරිජුඤ්ඤානි යෙහි පාරිජුඤ්ඤේහි සමන්නාගතා ඉධෙකච්චේ කේසමස්සුං ඕහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජන්ති. කතමානි චත්තාරි. ජරාපාරිජුඤ්ඤං බ්‍යාධිපාරිජුඤ්ඤං භෝගපාරිජුඤ්ඤං ඤාතිපාරිජුඤ්ඤං, *මජ්ඣිමනිකාය II,* රට්ඨපාල සුත්ත, බු.ජ.මු., 436 පිටුව.
9. සචේ සද්ධිවිහාරිකෝ ගිලානෝ හෝති කාලස්සේව උට්ඨාය දන්තකට්ඨං දාතබ්බං මුඛෝදකං දාතබ්බං ආසනං පඤ්ඤාපේතබ්බං.........සචේ සද්ධිවිහාරිකෝ ගාමං පවිසිතුකාමෝ හෝති නිවාසනං දාතබ්බං පටිනිවාසනං පටිග්ගහෝතබ්බං කායබන්ධනං දාතබ්බං.........සචේ පිණ්ඩලාතෝ හෝති සද්ධිවිහාරිකෝ ච භුඤ්ජිතුකාමෝ හෝති උදකං දත්වා පිණ්ඩපාතෝ උපනාමේතබ්බෝ.........සචේ සද්ධිවිහාරිකෙ-ා් නහායිතුකාමෝ හෝති නහානං පටියාදේතබ්බං....*මහාවග්ගපාළි I,* බු.ජ.මු. 106 පිටුව.
10. පුන ච පරං භික්ඛවේ, සංඝෝ භින්නෝ හෝති. සංඝෝ බෝ පන භික්ඛවේ, භින්නේ අඤ්ඤමඤ්ඤං අක්කෝසා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිභාසා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරික්ඛේපා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිච්චජනා ච හොන්ති. තත්ථ අප්පස-න්නා චේව නප්පසීදන්ති, පසන්නානං ච ඒකච්චානං අඤ්ඤථත්තං හෝති. අයං භික්ඛවේ පඤ්චමෝ ධම්මෝ සද්ධම්මස්ස සම්මෝසාය අන්තරධානාය සංවත්තති, *අංගුත්තරනිකාය., V,* අසමය සමය සුත්ත, බු.ජ.මු., 104 පිටුව.